# දේශීය කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ව්‍යාප්ති සේවය ආශ්‍රිත ගැටළු

**කෘෂි** කර්මාන්තය ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයට කරනු ලබන දායකත්වය ක්‍රමයෙන් දශක කිහිපයක් තිස්සේ පහත වැටෙමින් පැවතිය ද ජනගහනයෙන් 70% පමණ ජීවත්වන ග්‍රාමීය ප්‍රදේශවල තවදුරටත් ප්‍රධානම ජීවනෝපාය මාර්ගය වන්නේ කෘෂිකර්මාන්තයයි. විශේෂයෙන්ම, දේශීය කෘෂිකර්මාන්තය මෙරට බහුතර ග්‍රාමීය ජනතාවගේ ආහාර සුරක්ෂිතතාවය සහ ආදායම් උත්පාදනය සම්බන්ධයෙන් වඩාත්ම තීරණාත්මක වේ. නිදහසින් පසුව බලයට පත් සෑම රජයක්ම මෙන් දේශීය කෘෂිකර්මාන්තය නගා සිටුවීම වෙනුවෙන් දරන ලද උත්සාහයන්ගේ ප්‍රතිඵලයක් ලෙස වර්තමානය වන විට එම අංශය සාපේක්ෂ වශයෙන් වර්ධනයක් ලබා ඇති බව පැහැදිලි ය. නිදසුනක් ලෙස මෙරට 1950 වර්ෂයේ මෙ.ටො. 459,000 වූ වී නිෂ්පාදනය මේ වන විට මෙ.ටො. 3,652,000 දක්වා වර්ධනය වී ඇත. එසේම, වී වගාව සඳහා වෙන් කරන ලද භූමි ප්‍රමාණය ඉහත කාල පරිච්ඡේදය තුළ 120%කින් වර්ධනය වී තිබේ. ගල්ඔය, මහවැලිය වැනි දැවැන්ත සංවර්ධන යෝජනා ක්‍රම මෙන්ම නව කෙටි කාලීන වී වර්ග හඳුන්වාදීම සහල් නිෂ්පාදනයේ සීඝ්‍ර වර්ධනයට හේතු විය. විවිධ හේතූන් මත විටින් විට වෙනස්වීම්වලට ලක් වුව ද, මේ වන විට දේශීය සහල් නිෂ්පාදනය රටේ සමස්ථ පාරිභෝජන අවශ්‍යතාවන් සම්පූර්ණයෙන්ම මෙන් සපුරාලීමට ප්‍රමාණවත් තත්ත්වයට පත්ව තිබේ.

මෙයට අමතරව වෙනත් ආහාර බෝග නිෂ්පාදනයේ ද සැලකිය යුතු වර්ධනයක් පසුගිය දශක 6ක කාලය තුළ සිදු වී ඇත. කෙසේ වෙතත්, මෙරට දේශීය ආහාර බෝග නිෂ්පාදනය එසේත් නැත්නම් දේශීය කෘෂිකර්මාන්තය නිදහසින් පසුව මෙපමණ දීර්ඝ කාලයක් ගෙවී ඇතත්, සතුටුදායක තත්ත්වයකට පත්ව නොමැති බව රහසක් නොවේ.

ආසියාවේ ශ්‍රී ලංකාවට ආසන්න අනෙකුත් රටවල් කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ පසුගිය දශක කිහිපය තුළ ලබා ඇති වර්ධනය හා සාපේක්ෂව බැලිමේ දී මෙම තත්ත්වය වඩාත් පැහැදිලි ය. මෙරට දේශීය කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රය අර්බුදයකට ලක්ව ඇති බව වාර්ෂිකව අත්‍යවශ්‍ය ආහාර පාන ආනයනය කිරීම සඳහා වැය කරනු ලබන විශාල විදේශ විනිමය ප්‍රමාණය හා ආනයනය කරනු ලබන ආහාර ද්‍රව්‍ය ප්‍රමාණයන්ගෙන් පමණක් වුව ද සනාථ වේ. මෙපමණ විශාල විදේශ විනිමය ප්‍රමාණයක් වැය කිරීමට සිදුව ඇත්තේ අපට දේශීය වශයෙන් රටේ පාරිභෝජන අවශ්‍යතාවය උදෙසාවත් අවම වශයෙන් නිෂ්පාදනය කරගත හැකි ආහාර ද්‍රව්‍ය සඳහායි. 2008 වර්ෂයේ දී පමණක් මෙරටට ආනයනය කරන ලද ආහාර ද්‍රව්‍යයන්ගේ වටිනාකම රු. මිලියන 123,203 ක් වීමෙන් අලෙවි ආහාර ද්‍රව්‍ය ආනයනය සඳහා පිටතට ඇදී යන ධනස්කන්ධය මෙන්ම අප කෙතරම් අපගේ ආහාර අවශ්‍යතාවයන් සඳහා ආනයන මත රැඳී ඇත්ද යන්න පැහැදිලි වේ. සාපේක්ෂව ලෝකයේ කෘෂිකර්මාන්තය සඳහා වෙනත් රටවල් විසින් වෙන් කරන ලද මුළු භූමි ප්‍රමාණය හා සැසඳීමේ දී, ශ්‍රී ලංකාව සිය මුළු භූමි ප්‍රමාණයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් වී සඳහා වැයකර තිබේ. උදාහරණ ලෙස චීනය සිය භූමි ප්‍රමාණයෙන් 14%ක් පමණ වූ කෘෂිකර්මාන්තය සඳහා සුදුසු ඉඩම් ප්‍රමාණයක් යොදා ගනිමින් ලෝක ජනගහනයෙන් 1/5 වන එනම්, බිලියන 1.3 වන සමස්ථ චීන ජනගහනය ද ආහාරයෙන් පෝෂණය කරමින් බොහෝ කෘෂිකාර්මික නිෂ්පාදනයන් අපනයනය කිරීම අතින් ලෝකයේ ප්‍රමුඛයා බවට පත්ව සිටී. ඔවුන්ට එම හාස්කම සිදු කිරීමට හැකියාව ලැබුනේ මීට දශක 3 ක පමණ ඉහත සිදු කරන ලද ප්‍රතිසංස්කරණයන් සමග වන අතර අප දශක 6ක පමණ නිදහසින් පසුව ගමන් කොට කෘෂිකාර්මික අංශය සඳහා රටේ සමස්ථ භූමි ප්‍රමාණයෙන් 30% පමණ වෙන් කර තිබුණත් මිලියන 20 පමණ වූ ජනගහනයට වත් ප්‍රමාණවත් පරිදි ආහාර අවශ්‍යතාවය දේශීයව සපයා ගැනීමට නොහැකි තත්ත්වයකට පත් ව ඇත.

ඉන්දියාව, තායිලන්තය, කාම්බෝඩියාව, මියන්මාරය වැනි රටවල් හා සසඳ බැලීමේ දී ද ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික නිෂ්පාදනයන්ගේ ඵලදායීතාවය බෙහෙවින් අඩුවන අතර ඒ හේතුවෙන් අපගේ කෘෂිකාර්මික නිෂ්පාදනයන්ගේ ඒකක පිරිවැය ද ඉහළ ගොස් තිබේ.

ශ්‍රී ලංකාවේ දේශීය කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ පවතින අර්බුදයට හේතු වී ඇති කාරණා ගණනාවක්ම පවතී. ඒ අතර නව තාක්ෂණය ප්‍රමාණවත්ව යොදා ගැනීම සම්බන්ධව ගැටළු ඇත.

චීනය, ඉන්දියාව, තායිලන්තය හා අනෙකුත් ආසියාතික රටවලට සාපේක්ෂව අප විසින් කෘෂිකර්මාන්තය සඳහා නව තාක්ෂණය යොදා ගැනීම අඩු මට්ටමක පවතී. ඒ අංශයේ ආයෝජනය දේශීය කෘෂිකර්මාන්තයේ සංවර්ධනයට ඉතා වැදගත් වේ. මීට අමතරව, මෙරට පාරිසරික හා භූගෝලීය තත්ත්වයන්ට අනුකූල වන බීජ නිෂ්පාදනය හා වගා ක්‍රම පිළිබඳව පර්යේෂණ ප්‍රමාණවත් පරිදි සිදු කෙරෙයි. ඒ සඳහා මූල්‍ය ආයෝජනයන් සිදු කිරීම හා කෘෂි ව්‍යාප්ති සේවා තුළ පවත්නා ගැටළු නිරාකරණය ද දේශීය කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා අත්‍යාවශ්‍ය වේ.

එමගින් කෘෂි කර්මාන්තය ලාභදායී ව්‍යාපාරයක් බවට පත් කොට එහි නියුක්ත වූවන්ගේ ආදායම් වර්ධනය මෙන්ම රටේ සමස්ථ ආර්ථික සංවර්ධනය සඳහා එම ක්ෂේත්‍රයේ දායකත්වය උපරිම කර ගැනීමට අවස්ථාව උදා වනු නො අනුමාන ය.

**ව්‍යාප්ති සේවය**

කෘෂිකාර්මික ව්‍යාප්ති සේවයේ ආරම්භය සනිටුහන් වන්නේ කවද, කවර ස්ථානයක ද යන්න නිවැරදිව ම කිව නොහැකි ය. එසේ වුව ද, වසර 2000කට පමණ ඉහත දී කෘෂිකර්මාන්තය පිළිබඳ ප්‍රතිපත්ති සකස් කිරීම හා ප්‍රායෝගික දැනුම හා උපදෙස් ලබාදීම චීනය තුළ සිදු වී ඇති බවට සාක්ෂි ලැබී තිබේ.

ක්‍රි.පූ. 8 වන සියවසේ දී චීනයේ ජොව් (Zhou) අධි රාජ්‍ය සමය තුළ කෘෂිකර්මාන්තය පිළිබඳව වගකිව යුතු ඇමතිවරයෙක් සිටි බවට වාර්තා පවතී. කෙසේ වෙතත්, වර්තමානයේ ක්‍රියාත්මක වන ආකාරයේ සංවිධිත කෘෂි ව්‍යාප්ති සේවයේ ආරම්භය හා විකාශනය සිදුවන්නේ 19 වන සියවසේ අග භාගයේ සිට ඇමරිකා එක්සත් ජනපදයෙනි. එසේ වුව ද, කෘෂි ව්‍යාප්ති සේවයට අදාළ පළමු සිදුවීම ලෙස ගැනෙන්නේ 1845-1951 කාලය තුළ අයර්ලන්තයේ අර්තාපල් වගාවට බලපෑ උවදුරක් ප්‍රායෝගික උපදෙස් දෙන්නන් (Practical instructors) සම්බන්ධයෙන් යොදා ගැනීමේ සිද්ධියයි. (Jones and Garforth, 1997)

විවිධ යුගයන්හි මතු වූ විවිධ සංකල්ප ඔස්සේ විකාශනය වී වර්තමානය වන විට පුළුල් විෂයයක් බවට පත්ව තිබෙන ව්‍යාප්ති සේවය විවිධාකාරයෙන් අර්ථ දැක්වීමට බඳුන් වී ඇත. පහත දැක්වෙන්නේ විවිධ කාල පරිච්ඡේදයන් කිහිපයක් තුළ කෘෂිකර්ම ව්‍යාප්තිය යන්න අර්ථ දැක්වීමට ලක්ව ඇති ආකාරයයි.

1. "කෘෂිකාර්මික ව්‍යාප්තිය යනු ග්‍රාමීය ජනතාවට පාසලෙන් බාහිර වූ දැනුම ලබාදීමේ ක්‍රමවේදයකි." (සේවියල් - 1965)
2. "කෘෂිකාර්මික ව්‍යාප්තිය ග්‍රාමීය ගොවි ජනතාවගේ වගා ක්‍රම, තාක්ෂණය පිළිබඳ දැනුම වර්ධනය කරමින් නිෂ්පාදන කාර්යක්ෂමතාවය හා ආදායම් මට්ටම, සමාජ හා අධ්‍යාපන මට්ටම ඉහළ දමන අධ්‍යාපන ක්‍රමවේදයකි." (මොන්සර් - 1973)
3. "කෘෂිකාර්මික ව්‍යාප්තිය යනු සන්නිවේදන මැදිහත්වීම් මාලාවක ඒකරාශියක් වන අතර එමගින් අනෙකුත් දෑ අතර සංවර්ධනය හා ගැටළුකාරී අවස්ථාවන් නිරාකරණය සඳහා අවශ්‍ය වන හැකියාව ගොඩනැගීම සිදු වේ." (ලූවිස් - 2004)

මෙම අර්ථ දැක්වීම් අනුව වර්තමාන කෘෂි ව්‍යාප්තිය කෘෂිකාර්මික ප්‍රජාවගේ ජීවන උපාය හා ඒ ආශ්‍රිත ගැටළු නිරාකරණය කිරීම සඳහා පමණක් සීමාවූවක් ලෙස නොව ඔවුන්ගේ සමස්ථ ජීවන තත්ත්වය සංවර්ධනය සඳහා වූ ප්‍රවාහයක් ලෙස අවබෝධ කර ගත යුතු ය.

මීට දශක 6 ක පමණ කාලයකට පෙර අසල්වැසි ඉන්දියාව තුළ කෘෂි ව්‍යාප්ති සේවය ක්‍රියාත්මක වූ ආකාරය දෙස බැලීමේ දී ඔවුන් ඉහත සඳහන් වූ ආකාරයට ජන ජීවිතය සංවර්ධනයේ ඒකාබද්ධ ප්‍රවාහයක් ලෙස කෘෂි ව්‍යාප්තිය සේවය යොදා ගෙන පැවති බව පෙනේ.

**ශ්‍රී ලංකාවේ දේශීය කෘෂි ව්‍යාප්ති සේවය**

**යටත් විජිත යුගය**

ශ්‍රී ලංකාව ඉංග්‍රීසි යටත් විජිතයක් බවට පත්වීම සමග මෙරටට වැවිලි බෝග වගාව හඳුන්වාදීම තුළ මෙතෙක් රාජ්‍ය අනුග්‍රහය ලබමින් ක්‍රියාත්මක වූ දේශීය ආහාර බෝග වගාව නො සැලකිල්ලට හා අසාධාරණයට ලක් වූ බව අපි දනිමු. ඉංග්‍රීසි පාලකයන්ගේ ප්‍රධානම අපේක්ෂාව වැවිලි බෝග වගාව තුළින් ලාභ ලැබීම හේතුවෙන් හා ඒ සඳහා දේශීය ගොවි ජනතාවගේ ඉඩකඩම් විවිධ අසාධාරණ අණපනත් හරහා පවරා ගැනීම මෙන්ම වැවිලි ක්ෂේත්‍රයේ නියැලි සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ ආහාර අවශ්‍යතාවයන් ආනයනයන් තුළින් ඉටුකරලීමත් හේතුවෙන් දේශීය කෘෂිකර්මාන්තයට පරිහානියට යෑම වැළැක්වීමට නො හැකි විය.

කෙසේ වෙතත්, කල් යත්ම ලෝකයේ වරින් වර හටගත් පාරිසරික හා දේශපාලන අර්බුදයන් හමුවේ ආහාර ආනයනය සම්බන්ධයෙන් ඇති වූ ගැටළු මත බ්‍රිතාන්‍ය පාලකයින් මෙරට ආහාර අවශ්‍යතාවය රට තුළම නිෂ්පාදනය සඳහා පෙළඹුනි.

එසේ වුව ද, නිදහස ලබන අවධිය වන විට ලංකාව මූලික වශයෙන් ආහාර ආනයනය කරන රටක් බවට පත්ව තිබුණි. ඉංග්‍රීසි පාලන යුගයේ මෙරට කෘෂිකර්මාන්තය සම්බන්ධයෙන් ගත් වැදගත් පියවරක් ලෙස 1912 දී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පිහිටුවීම සඳහන් කළ හැකිය.

කෙසේ වෙතත්, ආරම්භයේ දී ඉන් අරමුණු කළේ මූලික වශයෙන් වැවිලි බෝග වගාවන්ට අවශ්‍ය සේවා සම්පාදනය කිරීමයි.

එසේ වුව ද, 1921 දී ඒ ඒ වැවිලි බෝග සඳහා වෙන වෙනම පර්යේෂණ ආයතන ස්ථාපිත කිරීමත් සමග කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මුළුමනින්ම දේශීය කෘෂිකර්ම අංශයේ සංවර්ධනයේ භාරකරු විය.

1923 දී මුළු රටම කොටස් තුනකට බෙදා ප්‍රාදේශීය

කාෂිකර්ම නිලධාරීන් තුනක් පත් කළ අතර ඔවුන්ට සහාය වීමට කෘෂිකර්ම උපදේශකවරුන් (AIs) කිහිප දෙනෙක් පත් කරන ලදී. මෙය මෙරට ව්‍යාප්ති සේවය සංවර්ධනයේ වැදගත් අවස්ථාවකි. තව ද, දෙවන ලෝක යුද්ධය සමග ඇති වූ ආහාර අර්බුදය හමුවේ ආහාර බෝග වගාව වර්ධනය කර ගැනීමේ අරමුණින් සහල් නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා විශේෂ වූ වී වගා උපදේශක මණ්ඩලයක් පත් කරන ලද අතරම ප්‍රාදේශීය කෘෂිකර්ම නිලධාරීන් සංඛ්‍යාව වැඩිකරන ලදී.

## නිදහසින් පසු කාලය

යටත් විජිත ව පැවති අනෙකුත් රාජ්‍යයන්ගේ මෙන් ම ශ්‍රී ලංකාවේ ද දේශීය කෘෂිකර්මාන්තය කෙරෙහි ප්‍රමාණවත් අවධානය යොමුවීම ආරම්භ වන්නේ නිදහස ලැබීමත් සමග ය. වල් බිහිවීමට අතහැර දමා පැවති වාරිමාර්ග ප්‍රතිසංස්කරණය කිරීම නව ඉඩම් වගාව සඳහා යොදා ගැනීම නිදහසින් පසුව සිදුවන අතර ව්‍යාප්ති සේවයේ පුළුල්වීම ද මෙයට සමගාමීව සිදු වේ.

1952 දී කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ආහාර නිෂ්පාදන දෙපාර්තමේන්තුව (DFP) ස්ථාපිත කිරීම හා ඊට අදාළව ක්‍රියාත්මක වීම සඳහා නිලධාරීන් 500 බඳවා ගැනීම සිදු විය. මෙම පිරිස පසුව කෘෂි ව්‍යාප්ති සේවකයින් ලෙස හැඳින්වීමට ලක් වූ අතර 1987 දී එම තනතුර අහෝසි කරන තෙක් ග්‍රාමීය මට්ටමේ කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය ශක්තිමත් කිරීමට ඔවුන් විසින් විශාල දායකත්වයක් දක්වන ලදී. 1957 වර්ෂයේ දී දේශීය කෘෂිකර්ම ව්‍යාප්ති සේවය සංවර්ධනය වෙනුවෙන් පහත දැක්වෙන ක්‍රියාමාර්ගයන් ගනු ලැබීය.

1. "කෘෂිකාර්මික කලාප අනුව පර්යේෂණ ආයතන පිහිටුවීම.
2. කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය සඳහා නව සංවිධාන රාමුවක් ඇති කිරීම හා ව්‍යාප්ති කාර්ය මණ්ඩලය වැඩි කිරීම.
3. දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරී තනතුර හඳුන්වාදීම.
4. ශ්‍රී ලංකාවේ ප්‍රථම වතාවට ග්‍රාමීය මට්ටමේ ව්‍යාප්ති නිලධාරියෙක් හඳුන්වාදීම.

1963 දී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව තුළ ව්‍යාප්ති සේවය සඳහා වෙනම නියෝජ්‍ය අධ්‍යක්ෂ ධුරයක් ඇති කිරීම සිදුවිය. ඉන් අනතුරුව ජාතික හා දිස්ත්‍රික් මට්ටමෙන් සේවය සඳහා කෘෂිකාර්මික නිලධාරීන් (Agricultural officer) පත් කිරීමත් ගොවිජන සේවා මධ්‍යස්ථාන පිහිටුවීම හා කෘෂිකර්ම උපදේශකවරු ඊට අනුබද්ධ කිරීමත් ව්‍යාප්ති සේවයේ වර්ධනයට ඉවහල් විය.

ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම ව්‍යාප්ති හා පර්යේෂණ ක්ෂේත්‍රයට අදාළව ලෝක බැංකු ව්‍යාපෘතියකට අනුව (Agricultural Extension and Adeptive Research Project) හඳුන්වා දෙන ලද පුහුණු හා හමුවීම් (Training and visit) ව්‍යාප්ති විධික්‍රමය මෙරට ව්‍යාප්ති සේවයේ කඩඉමක් සනිටුහන් කරයි.

මෙය ක්‍රමවත් ව්‍යාප්ති ක්‍රමවේදයකින් යුක්ත වූ අතර පෙර පුහුණුවීම් ලද ව්‍යාප්ති නිලධාරීන් විසින් ගොවීන් ඔවුන්ගේ ක්ෂේත්‍රයේ දීම හමුවී දැනුම බෙදදීම මෙහි දී සිදුවිය. මෙම ක්‍රම තුළින් ව්‍යාප්ති නිලධාරීන්ට විධිමත් හා ක්‍රමවත් පුහුණුවක් ලැබීම මෙන්ම ගොවීන් ට කාර්යක්ෂම දැනුම ගලා යාමක් ද සිදු විය. කෙසේ වෙතත්, අදාළ ලෝක බැංකු ව්‍යාපෘතිය නිමවීමත්, මෙම ව්‍යාප්ති ක්‍රමවේදය වියදම් අධික සහ ඒ තුළ වෙනත් තාක්ෂණික ගැටළු හේතුවෙන් පුහුණු හා හමුවීම් ව්‍යාප්ති ක්‍රමය තවදුරටත් පවත්වාගෙන යාමට නො හැකි විය.

ඉහත කී ලෝක බැංකු ව්‍යාපෘතිය අවසන් වීමත් සමගම මෙරට ව්‍යාප්ති සේවයේ කොඳු නාරටිය බඳු වූ කෘෂිකර්ම ව්‍යාප්ති සේවක ධුරය (KVS) අහෝසි කිරීම මෙරට දේශීය කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රයේ ව්‍යාප්ති සේවයට බලපෑමක් සිදු කරන ලදී.

1993 දී මෙරට ව්‍යාප්ති සේවය තුළ පැන නැගී තිබූ දුර්වලතා මගහැරවීම සඳහා ලෝක බැංකුව විසින් දෙවන ඒකාබද්ධ කෘෂිකර්ම ව්‍යාප්තිය භාවිතයෙන් ව්‍යාපෘතියක් හඳුන්වා දෙන ලද අතර මෙය ගොවියා කේන්ද්‍ර කොට ගත් ඒකාබද්ධ ව්‍යාප්ති ක්‍රමවේදයක් අනුගමනය කළේය. එය කෘෂිකාර්ම දෙපාර්තමේන්තුව, සත්ත්ව නිෂ්පාදන දෙපාර්තමේන්තුව, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ආදී සියළුම ආයතන ඒකාබද්ධ කර ගන්නා ලද්දකි. සහභාගීත්ව ක්‍රමවේදය ආශ්‍රයෙන් ගැටළු හඳුනාගැනීම, විශ්ලේෂණය හා විසඳුම් ලබාදීම අරමුණු කරගත් මෙම ක්‍රමවේදය අසාර්ථක වූ අතර නියමිත වකවානුවට පෙර අත්හැර දැමීමට සිදු විය.

## දේශීය කෘෂි ව්‍යාප්ති සේවයේ වර්තමාන ස්වරූපය

මෙරට දේශීය කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රය තුළ දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාප්ති සේවය 1987 දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට හඳුන්වා දෙන ලද හා 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ට හඳුන්වා දෙන ලද සංශෝධනයන් අනුව සකස් වූවක් වේ. මෙම ව්‍යවස්ථා සංශෝධනය මගින් මෙරට පරිපාලනයට පළාත් සභා නමින් දෙවන පෙළ

පරිපාලන යාන්ත්‍රණයක් හඳුන්වා දෙන ලදී. ඒ අනුව මෙතෙක් මධ්‍යම ආණ්ඩුව විසින් සිදු කර ඇති පරිපාලන කාර්යයන් පළාත් සභා වෙත පැවරීම සිදු විය. ඒ අනුව, මෙතෙක් මධ්‍යම ආණ්ඩුවේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් සිදු කළ ඇතැම් ව්‍යාප්ති සේවය පළාත් සභාවට පවරන ලදී. (කෙසේ වෙතත්, අන්තර් වාරිමාර්ග බල ප්‍රදේශ ව්‍යාප්ති සේවය මධ්‍යම ආණ්ඩුව එනම් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් සිදු වේ.)

මහවැලි බල ප්‍රදේශයන් තුළ ව්‍යාප්ති සේවය ඒ අයුරින්ම මහවැලි අධිකාරිය විසින් ම සිදු කිරීම හේතුවෙන් දැනට දේශීය කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ව්‍යාප්ති සේවය සිදු කරන ප්‍රධාන රාජ්‍ය ආයතන සංඛ්‍යාවෙන් තුනකි. එනම්, පළාත් සභා, මධ්‍යම ආණ්ඩුව (කෘෂිකර්ම දෙපාර්තමේන්තුව) හා මහවැලි අධිකාරිය වශයෙනි. මෙයින් වඩාත් ම පුළුල් පරාසයක ක්‍රියාත්මක වන්නේ පළාත් සභා ව්‍යාප්ති සේවයයි.

සාපේක්ෂ වශයෙන් ගත් කළ මහවැලි අධිකාරිය යටතේ එම ප්‍රදේශවල ව්‍යාප්ති සේවය යම් පමණක සතුටුදයක තත්ත්වයක් පෙන්නුම් කළ ද, සමස්තයක් ලෙස දේශීය කෘෂිකර්ම ක්ෂේත්‍රයේ ව්‍යාප්ති සේවය මේ වන විට ප්‍රබල කඩා වැටීමකට ලක්ව ඇති බව පෙනේ.

ශ්‍රී ලංකාවේ දේශීය කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රයේ ව්‍යාප්ති සේවයේ සංවර්ධනය" (Research on the existing extension service in the domestic agricultural sector in Sri Lanka - P.C.J. De Silva, 2010 Un published) නමැති පශ්චාත් උපාධි නිබන්ධන අධ්‍යයනය මගින් ශ්‍රී ලංකාවේ දේශීය කාෂිකර්මාන්තයේ ව්‍යාප්ති සේවයට අදාළ පහත දැක්වෙන ගැටළු හඳුනා ගෙන ඇත. එකී ගැටළුවලට විසඳුම් ලබාදීම මෙරට දේශීය කෘෂි ව්‍යාප්ති සේවයේ සාර්ථකත්වයට මෙන්ම රටේ සමස්ත කෘෂිකර්මාන්තයේ ම යහපතට හේතු වනු නො අනුමාන ය.

**කෘෂි ව්‍යාප්ති සේවය ආශ්‍රිත ගැටළු**

1. ව්‍යාප්තිය සම්බන්ධ විශේෂඥ දැනුමක් සහිත බිම් මට්ටමේ නිලධාරීන් නො සිටීම.
2. ව්‍යාප්ති සේවය තුළ පොදු ඒකීයත්වයක් ඇති කිරීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණයක් හෝ ඒ සඳහා වන ආයතනයක් නොවීම. මේ තත්ත්වය තුළ විවිධ පළාත් සභාවල ව්‍යාප්ති සේවය ක්‍රියාත්මකවීම විවිධ ස්වරූප ගැනීම මෙන්ම පළාත් සභා හා මධ්‍යම ආණ්ඩුවේ ව්‍යාප්ති සේවය අතර ද සම්බන්ධීකරණයක් හා සම්මුතියක් ඇතිවීමේ හැකියාව ඇහිරීම.
3. ව්‍යාප්ති සභාය ඊට අනුලංගනීය වූ පර්යේෂණ එකිනෙකට වෙනස් පරිපාලන යාන්ත්‍රණයන්ට අයත් විෂයයන් වීම සහ එම නිසා ව්‍යාප්ති සේවය පර්යේෂණ අංශයෙන් ලැබිය යුතු පෝෂණය ක්‍රමවත් ව නො ලැබීම මෙන්ම ව්‍යාප්ති සේවය තුළින් පර්යේෂණ ගැටළු අදාළ ක්ෂේත්‍රයන්ට නිසි ලෙස යොමු නොවීම. (මෙයට හේතුව ව්‍යාප්ති සේවය මූලික වශයෙන් පළාත් සභාවන්ටත් පර්යේෂණ කාර්ය මධ්‍යම ආණ්ඩුවටත් අයත් විෂයයන් වීම)
4. ප්‍රාදේශීය මට්ටමේ ව්‍යාප්ති නිලධාරීන්ට ප්‍රායෝගිකව සේවයක් සැපයිය නොහැකි තරම් ගොවීන් පිරිසකට සේවය සැපයීමට සිදු ව තිබීම.
5. ව්‍යාප්ති නිලධාරීන්ට ව්‍යාප්ති කාර්යයන්ට අමතරව බොහෝ විට ව්‍යාප්ති නො වන කාර්යයන් පැවරීම හා රැස්වීම්වලට සහභාගීවීම හා ලිපි ලේඛන සකස් කිරීම වැනි කාර්යයන් සඳහා කාලය මිඩංගු කිරීමට සිදුව තිබීම.
6. ව්‍යාප්ති නිලධාරීන්ට ක්‍රමවත්ව පුහුණුවීම් නො ලැබීම සහ නිසි ඇගයීමක් නො ලැබීම.
7. ව්‍යාප්ති නිලධාරීන්ගේ රැකියා තෘප්තිමත් බව හීනවීම විශේෂයෙන්ම ඉහළ නිලධාරීන්ගේ සහාය නිසි පරිදි නො ලැබීම හා ඉහළ නිලධාරීන් සමග යහපත් සබඳතාවක් ගොඩනැගී නො තිබීම.
8. ව්‍යාප්ති නිලධාරීන්ට ප්‍රවාහන පහසුකම් ප්‍රමාණවත්ව නො ලැබීම හා ඒ හේතුවෙන් ඔවුන්ට ගොවීන් වෙනුවෙන් කාර්යක්ෂම සේවාවක් සැපයීම අපහසුවීම.
9. ව්‍යාප්ති නිලධාරීන්ගේ දැනුම ප්‍රමාණවත් පරිදි යාවත්කාලීන වීම පිළිබඳ ගැටළු පැවතීම හා ඒ හේතුවෙන් ගොවීන්ට අවශ්‍ය දැනුම ව්‍යාප්ති නිලධාරීන් වෙතින් ලැබීම පිළිබඳ ගැටළු පැන නැගී තිබේ.
10. ඉහත 9 හි සඳහන් කරන ලද හේතු මෙන් ම ව්‍යාප්ති නිලධාරීන් මුණ ගැසීම පිළිබඳ ඇති ගැටළු හේතුවෙන් ගොවීන්ට ව්‍යාප්ති සේවය පිළිබඳ ප්‍රසාදයක් නොවීම.
11. පෞද්ගලික යෙදවුම්, අලෙවි ආයතන, නව සන්නිවේදන උපකරණ යොදා ගනිමින් කරනු ලබන ව්‍යාප්ති සේවය ගොවීන් අතර ජනප්‍රිය වීම හා ඒ හරහා රජයේ ව්‍යාප්ති සේවය යල් පැන ගිය ස්වරූපයක් ගෙන තිබීම.
12. දැනට පවත්නා ව්‍යාප්ති සේවය ව්‍යාප්ති අවශ්‍යතාවයන් හා ඉල්ලුම මත ක්‍රියාත්මක වන්නක් නොවීම.

**චතුර ජයම්පති ද සිල්වා**

*පර්යේෂණ නිලධාරි*

**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය**